DOI: 10.31357/fhssmst.2005.00027

# නූතන සිංහල නාට්‍යයන්හි අංග රචනා විධි

(1980-2004 රාජ්‍ය නාට්‍ය උළෙලේ අවසන් වටයේ නාට්‍ය ඇසුරිණි)

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ නාට්‍ය හා රංග කලාව ශාස්ත්‍රපති උපාධි අවසන් වසර පරීක්ෂණය සඳහා වූ ස්වාධීන නිබන්ධය


නම :- සෙනරත් දිසානායක

විභාග අංකය :- MA/DT/0010

ලියාපදිංචි අංකය :- GS/HU/1640/2002

# පිදුම.

මා ඇතිදැඩි කොට

ලොවට දායාද කළ

ආදරණීය මෑණියන්ට සහ පියාණන්ටත්

නැණැස වැඩූ ගුරුවරුන්ටත්

බැති සිතින් පුදමි.

## උපකාරානුස්මෘති.

නූතන සිංහල නාට්‍යන් හි අංග රචනා විධි නමින් යුත් මෙම පර්යේෂණ කෘතිය සාර්ථක කර ගැනීමට ගුරුහරුකම් හා උපකාරීවූවෝ බොහෝය. එයින් අවශ්‍යයෙන් ම සිහිකළ යුතු කිහිප දෙනෙකි.

පාඨමාලාවේ සමායෝජක ලෙස කටයුතු කළ මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාට ප්‍රථමයෙන් ම ගෞරව පූර්වක කෘතඥතාවය පුද කරමි.

ලෝකයේ අංග රචනා ක්‍රම බිහිවීම හා ශ්‍රී ලංකාවේ අංග රචනා කලාව පිළිබඳව කරුණු සොයා දුන් පිළියන්දල ගෝමස් හේවා ශිල්පියාට,

1980 වර්ෂයේ සිට 2004 දක්වා නාට්‍යන් හි අංග රචනා පිළිබඳව වටිනා අදහස් රැසක් ලබා දුන් අංග රචනා ශිල්පීන් වන බුද්ධදාස ගලප්පත්ති, වසන්ත විට්ටච්චි, සුමේධ හේවාවිතාරණ, ප්‍රේම් ජයන්ත කපුගේ යන මහත්වරුන්ටත්,

නාට්‍යන්හි දර්ශන ඇතුලත් දුර්ලභ ඡායාරූප සපයා දෙමින් ඒ පිළිබඳව අදහස් දැක්වූ උදේනි අල්විස් සහෝදර කලාකරුවාණන්ටත්,

ජාතික තරුණ සේවා සභාවේ කාන්ති මහත්මිය සහ ඇගේ පුතණුවන් වන අසංක ටත්, ශ්‍යාමලී සොයුරියටත්, ගම්ලත් සොයුරාටත්,

මෙම පර්යේෂණ කෘතිය සාර්ථක කර ගැනීමට සහයෝගය දැක්විම වෙනුවෙන් දයාබරත්වයෙන් සිහිපත් කරමින් කෘතඥතාව පුදකර සිටිමි.

# හැඳින්වීම.

නාට්‍යක් රංගගත කිරීමේ දී අංග රචනයට වැදගත් තැනක් හිමි වේ. විශේෂයෙන් ම පින්තූර රාමු හෙවත් ප්‍රොසීනියම් ආර්ච් (Proscenium Arch) වේදිකාවක දී කෘත්‍රිම ආලෝක තත්ත්වයන් යටතේ නාට්‍ය රඟ දැක්වීමේදී අංග රචනය අත්‍යවශ්‍ය අංගයක් බවට පත්වී ඇත. සිංහල ගැමි නාටකය හා මුල් කාලීන සිංහල නාට්‍යයන් හි දියුණු අංග රචනා ක්‍රම භාවිත නොවුණි. නමුත් වර්තමානය වන විට ලෝකයේ දියුණු රටවල නාට්‍ය කලාවේ අංග රචනා ක්‍රම තාක්ෂණික ක්‍රම හා උපකරණ වර්ග යොදා ගැනීමටත් අනුගමනය කිරීමටත් ශ්‍රී ලාංකික නාට්‍යකරුවන් උත්සාහ දරන බව පෙනේ.

"නූතන සිංහල නාට්‍යන් හි අංග රචනා විධි" මැයෙන් අප රචනා කරන්නා වූ මෙම නිබන්ධයෙන් සළකා බලනුයේ 1980 වර්ෂයේ සිට 2004 වර්ෂය දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකාවේ වේදිකා නාට්‍යන් හි අංග රචනා සම්බන්ධයෙනි. රාජ්‍ය නාට්‍ය උළෙලේ අවසන් වටයේ නාට්‍ය පිළිබඳව වැඩි අවධානයක් යොමු කොට ඇති අතර, අවශේෂ නාට්‍යන් හි යම් විශේෂිත වූ අංග රචනාවන් ඇති විට ඒ පිළිබඳව කරුණු සොයා බලා ඇත.

රාජ්‍ය නාට්‍ය උළෙලේ දී අංග රචනය පිළිබඳව වූ සම්මාන දිනා ගත් ශිල්පීන් හා යෙදුනු කතා බහ සහ එම නාට්‍යන් හි අංග රචනා පිළිබඳ නිරීක්ෂණයන් තුළින් ලබා ගත් කරුණු මෙහි ඇතුලත් කොට ඇත. අනුවර්තන, පරිවර්තන, ස්වතන්ත්‍ර හා අභූත රූපී හෝ නාට්‍ය ධර්මි

නාට්‍යන් හි අංග රචනාවන් පිළිබඳව මෙහිදී වෙන වෙනම විමසීමක් කරනු ලැබේ.

පළමුවන පරිච්ඡේදයේ දී අංග රචනය යනු කුමක්ද, එහි ඉතිහාසය හා ලංකාවේ අංග රචනා කලාවේ ආරම්භය පිළිබඳව විමසීමක් කෙරේ. ආදී කාලීන මිනිසා ගේ වෙස් වළා ගැනීමේ ක්‍රම වේදයන් හි සිට නූතන නාට්‍යන් හි අංග රචනා ශිල්පය බිහිවීම දක්වා කාලය තුළ සිදුවූ නොයෙකුත් වෙනස්කම් දක්වා ඇත. එමෙන්ම නූතන නාට්‍යන් සඳහා සාර්ථක අයුරින් යොදා ගැනීමට ආලේපන වර්ග සකස් කර ගැනීම පිළිබඳවත් මේ පරිච්ඡේදයේ දී සාකච්ඡා කෙරේ

දෙවන පරිච්ඡේදයේ දී 1980 වර්ෂයේ සිට 2004 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ ස්වතන්ත්‍ර නාට්‍යන් හි අංග රචනා පිළිබඳව රාජ්‍ය නාට්‍ය උළෙලේ අවසාන වටයේ නාට්‍ය ඇසුරින් විමසීමක් කරනු ලැබේ. මෙහිදී ස්වතන්ත්‍ර නාට්‍යන් හි ලෝක ධර්මී හෝ නාට්‍ය ධර්මී අංග රචනා පිළිබඳවත්, අභූත රූපී ස්වතන්ත්‍ර නාට්‍යන් හි අංග රචනා පිළිබඳවත් අංග රචනා කළ ශිල්පීන් හා නාට්‍ය නිෂ්පාදකවරුන් ගේ අදහස් අනුව සාකච්ඡාවට බඳුන් කෙරේ

තුන්වන පරිච්ඡේදයේ දි 1980 - 2004 කාලය තුළ රාජ්‍ය නාට්‍ය උළෙලේ අවසන් වටයේ නාට්‍ය වල ඇති පරිවර්තන හා අනුවර්තන නාට්‍ය ද පරිවර්තන අභූත රූපී නාට්‍ය පිළිබඳව ද සාකච්ඡා කෙරේ.

හතරවන පරිච්ඡේදයේ දී මෙම පර්යේෂණයේ දී දැන ගන්නට ලැබුණු කරුණු අනුව බැසගත් නිගමනයන් හා එම නිගමනයන්ට අනුව අංග රචනා ශිල්පයේ දියුණුවට හා ශිල්පීන් ගේ ගුණාත්මක වර්ධනය සඳහා අවශ්‍ය කරන යෝජනා කිහිපයක් ද ඉදිරිපත් කොට ඇත.

අවසානයේ දී මූලාශ්‍රයයන් හැදින්විමත්, 1980 සිට 2004 දක්වා පැවැත්වූ රාජ්‍ය නාට්‍ය උළෙලේ අවසන් වටයේ නාට්‍යන් හි විශේෂත්වයක් දැක්වූ නාට්‍යන් හි අංග රචනා ඇතුලත් දර්ශන වල ඡායාරූප දක්වා ඇති අතර, එම ඡායාරූප ඇතුලත් නාට්‍යය, නාට්‍ය නිෂ්පාදක, චරිතයන් හා නාට්‍ය වේදිකා ගතවූ වර්ෂය ද සඳහන් කොට තිබේ.

# පටුන.


පිටුව

පිදුම i
උපකාරානුස්මෘති ii
හැඳින්වීම iii-iv
පටුන vi

1. පරිච්ඡේදය
අංග රචනය යනු කුමක්ද එහි ඉතිහාසය හා ලංකාවේ අංග රචනා කලාවේ ආරම්භය 1-17

2 පරිච්ඡේදය
ස්වතන්ත්‍ර නාට්‍යන් හි අංග රචනා 18-35

3. පරිච්ඡේදය
පරිවර්තන හා අනුවර්තන නාට්‍යන් හි අංග රචනා 36-46

4. පරිච්ඡේදය
නිගමන හා යෝජනා 47-53

මූලාශ්‍රයයන් හැඳින්වීම
ඡායාරූප විස්තරය

# 1 පරිච්ඡේදය.

## අංග රචනය යනු කුමක්ද? එහි ඉතිහාසය හා ලංකාවේ අංග රචනා කලාවේ ආරම්භය.

### අංග රචනය යනු කුමක්ද?

අංග රචනය යන වචනය හෝ ඉංගිරිසි භාෂාවෙන් make up යන වචනය හෝ භාවිතා කරන ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් වර්තමානයේ පවතී. ඒවා නම්,

1. සිනමාව
2. වේදිකා නාට්‍ය
3. ටෙලිනාට්‍යකරණය
4. ඡායාරූපකරණය යන ක්ෂේත්‍රයන් ය.

මෙම කලාංගයන් සඳහා අංග රචනය අත්‍යවශ්‍යම කරුණක් බවට පත්ව ඇති අතර ඒ ඒ ක්ෂේත්‍රවල සුවිශේෂීතාවන් අනුව අංග රචනා විධීන් හි යම් වෙනස්කම් රාශියක් දක්නට ලැබේ. කෙසේ නමුත් අංග රචනා කිරීමේදී මෙම ක්ෂේත්‍ර හතරෙහිම මූලික පදනම එක හා සමාන වේ. එනම් අවශ්‍යකරන රූපය හොඳින් මතුකර පෙන්වීමට අවශ්‍ය ආකාරයට සකසා ගැනීමයි. අංග රචනාවක් යනු කුමක්ද? යන්න සලකා බැලීමේදී මේ පිළිබඳව යම් අදහසක් ඇතිකර ගත හැකිය. සිනමාව , ඡායාරූපය හා ටෙලිනාට්‍යකරණය යන අංශයන් මූලිකවම නූතන තාක්ෂණික රසායනික ක්‍රියාවලියක් වන අතර වේදිකා නාට්‍ය ස්වභාවික සජීව මාධ්‍යයක් වේ.

"අංග රචනය යනු ශරීරයේ ඇඳුම් වලින් නොවැසෙන කොටස රචනය කිරීම නැතහොත් මතු කිරීමයි. "[1]

"අංග රචනය යනු ආලෝක තත්ත්වයන් ගෙන් ඇතිවන බාධාවන් මගහැර මුහුණෙහි ඇති හැඩතල චරිතයේ අවශ්‍යතාව අනුව ඉස්මතුකොට දැක්වීමයි. "[2]

" අංග රචනය චිත්‍ර ශිල්පය හා සමාන වූ ක්‍රියාවලියකි. චිත්‍ර ශිල්පියා කැන්වසය මත සිය නිර්මාණය සිදුකරන අතර අංග රචනා ශිල්පියාගේ කැන්වසය නළුවාගේ මුහුණ නැතහොත් චර්මය යි. ඒ මත හැඩතල, අඳුර ආලෝකය මතුවන අයුරින් චිත්‍රණය කිරීමයි. "[3]

ඉහත දක්වා ඇති අදහස් වලින් අවධාරණය වන කරුණක් නම් "මතුකොට දැක්වීම" යන අදහසයි. ස්වාභාවික හිරු එළිය හෝ කෘත්‍රිම ආලෝකය ශරීරය මත පතිත වූ විටක සමෙහි ඇතිවන දිලිසීම හෝ පැතලිවීම නිසා සිනමා හෝ රූපවාහිනී කැමරාවට නියම රූපය හඳුනාකර ගත නොහැකි වේ. එසේම වේදිකා නාට්‍ය වලදී ප්‍රේක්ෂකයන්ට නළුවාගේ සාත්වික අභිනයන් හොඳින් මතුකොට පෙන්වීමට අවශ්‍යවේ. එනිසා මේ කුමන ආකාරයේ අර්ථ දැක්වීම් තිබුනද රූපවාහිනිය, සිනමාව, ඡායාරූපකරණය යන ක්ෂේත්‍රයනගේ අංග රචනා වලින් වේදිකා නාට්‍ය අංග රචනාව වෙනස් වන බව පෙනේ. මෙයට හේතුවන කාරණාව වන්නේ වේදිකා නාට්‍ය කලාවේ ඇති සජීව බවයි. යම් නාට්‍යයක් රඟදක්වන්නේ ජීවමාන නළුනිළි පිරිසක් විසින් සජීව ප්‍රේක්ෂක පිරිසක්

---

1.2005.07.26 දින ශිල්පී ගෝමස් හේවා මහතා සමග කළ සාකච්ඡාව.

2.2005.07.20 දින ශිල්පී ජගත් පද්මසිරි මහතා සමග කළ සාකච්ඡාව

3.2005.07.21 දින ශිල්පී ජයන්තා රණවක මහතා සමග කළ සාකච්ඡාව.

වෙතය. එවිට දහසක් ප්‍රේක්ෂක ඇස් වේදිකාව වෙත යොමුවේ. මෙවිට වේදිකාව ඉදිරිපිට ලඟම සිටින ප්‍රේක්ෂකයාට මෙන්ම ශාලාවේ පිටුපස කොනේ වාඩිවී සිටින පුද්ගලයෙකුට වුවද නළුවා හොඳින් දර්ශනය විය යුතුවාක් මෙන්ම ඔහුගේ මුහුණේ හැඟීම් ඉරියව් හා චරිත ස්වභාවය වටහා ගැනීමටද පිළිවන් විය යුතුවේ. මේ නිසා අංග රචනා ශිල්පියාට විශාල කාර්යභාරයක් කිරීමට සිදුව තිබේ.

විශේෂයෙන් ම වේදිකා අංග රචනය කලාවක් ලෙස සළකා කිසියම් චරිත නිර්මාණයක් හා ආදේශ කිරීමේදී අවධානය යොමු කළ යුතු මූලික කරුණ වනුයේ එම නිර්මාණය ඉදිරිපත් කරන්නාවූ ශෛලිය පිළිබඳව සිත යොමු කිරීමයි. එනම්, එම නිර්මාණය (නාට්‍යය) අයත් වන්නේ ලෝක ධර්මී (තාත්වික) ශෛලියට ද නැතහොත් නාට්‍ය ධර්මී (ශෛලිගත) යන ශෛලියට ද යන්නයි. මේ අනුව අංග රචනයේ ශෛලිය ද (රටාව ද) විශාල වෙනස්කම් වලට අනුව සකස් වේ. බොහෝ විට මෙහිදී සිදුවිය යුත්තේ එම කෘතියේ නිර්මාපකයා නැත්නම් නාට්‍යයේ නිෂ්පාදකවරයා අනුගමනය කරන්නාවූ රංග ශෛලිය ශිල්පියා විසින් හඳුනා ගැනීමෙන් අනතුරුව අංග රචනය කළයුතු ආකාරය පිළිබඳව මූලික නිගමනයකට ඒමයි. ඊට පසු අදාල ශෛලිය අනුව ගොඩනැගිය යුතු මනුෂ්‍ය චරිත හා මනුෂ්‍ය නොවන චරිත වෙන් වශයෙන් හඳුනා ගැනීමයි.

නාට්‍ය ධර්මී හෝ ලෝක ධර්මී යන රංග ශෛලීන් එකිනෙකට වෙනස් වේ. ලෝක ධර්මී නාට්‍යවලදී ලෝක ස්වභාවය ඒ අයුරින් දැක්විය යුතුය. එය තාත්වික නැත්නම් ස්වභාවික අංග රචනයයි. නාට්‍ය ධර්මී අංගරචනයේදි ස්වභාවිකත්වයෙන් තොර නැත්නම් යම් කාල්පනික

වශයෙන් නිර්මාණය වූ අංග රචනා ක්‍රමයකි. එහි ඇත්තේ ස්වභාවිකත්වයේ එක්තරා සංකේතවත් රචනාවකි. මනමේ, සිංහබාහු හෝ ජපානයේ කබුකි අංග රචනා ශෛලිගත අංග රචනා වේ.

ලෝක ධර්මී නැත්නම් ස්වභාවික අංග රචනාවක් අප දන්නා සාමාන්‍ය ස්වභාවිකත්වයෙන් තොරය. නැතහොත් ස්වභාවික ලෝකයේ අයුරින් දැක්වීමක් නොවේ. එය එසේ වුවහොත් නාට්‍යයේ අර්ථය ප්‍රේක්‍ෂකයා වෙත ගෙන යාමට අපහසුවේ. එහි පැවතිය යුතු වන්නේ වේදිකාවට අවශ්‍ය ස්වාභාවිකත්වය යි. එය යම් ආකාරයක සැබෑ ලෝකයේ මට්ටමේ අංග රචනාවක් නොවේ. ස්වාභාවිකත්වය ඉක්මවූ වේදිකාවේ පාත්‍රයන් හඳුනා ගත හැකි සාමාන්‍ය ලෝකස්වභාවය ඉක්මවූ වේදිකා ස්වාභාවිකත්වය යි.[2]

මෙම වේදිකා ස්වාභාවිකත්වය තුළින් නාට්‍යයේ සැබෑ අර්ථය සතර අභිනය මගින් ප්‍රේක්‍ෂකයන් වෙත ගෙන යාමේදී අංග රචනා වලින් දැක්වෙන, උලුප්පා දක්වන සාත්වික අභිනය මතු කිරීම සඳහා වේදිකා යථාර්ථයෙන් යුතු අංග රචනා අවශ්‍ය වේ.

නාට්‍යයේ ශෛලිය හඳුනා ගත් පසු එහි චරිතස්වභාවයන් හඳුනා ගත යුතුය. ඒ සඳහා සොයා බැලිය යුතු අංග 07 ක් ඇත. [3]

1. ජන්ම ගතිය හා ආරය.

   එම චරිතයට ජාන ගති ලක්‍ෂණ නො එසේනම් පාරම්පරිකව උපතේදී ඇති වන්නාවූ ගති ලක්‍ෂණ ඇතුලත් විය යුතුද යන්න.

2. වටපිටාව හා පරිසරය

---

1. සංබ- රාජ්‍ය නාට්‍ය උත්සව විශේෂ කලාපය 2001 ජූලි-දෙසැම්බර් පිටුව 142
1. 2005.07.21 වන දින ශිල්පී ජයන්තා රණවක මහතා සමග කළ සාකච්ඡාව.
2. සංබ-රාජ්‍ය නාට්‍ය උත්සව විශේෂ කලාපය 2001 ජූලි-දෙසැම්බර් පිටුව 144

පරිසර දේශගුණික හේතුන් මත චරිතයේ ස්වභාවය කුමක් විය යුතු ද යන්න.

3. සෞඛ්‍ය තත්ත්වය

වර්තමාන ශරීර ශක්තිය රෝගී හෝ නිරෝගී ද යන වග.

4. ප්‍රකෘති ස්වාභාවය

චරිත තුලින් දැකිය හැකි ප්‍රකෘති හෝ විකෘති ස්වභාවයේ අවයව ඇත් ද යන වග.

5. යුගය

මෙම චරිතය අයත් වනුයේ කිනම් කාලයකටද (Period) යන වග.

6. වයස

එම චරිතය අයත් විය යුතු වයස් සීමාව.

7. පෞරුෂය හා මානසිකත්වය

එම චරිතය මනා වූ පෞරුෂයකින් යුතු ද නැතහොත් කුලෑටි ගතියෙන් යුතු ද යන්න හෝ මානසික විකෘති භාවයෙන් යුතුව සිටින්නේද යන වග.

මෙම කරුණු පිළිබඳව සොයා බැලිය යුතු වන්නේ නාට්‍ය පිටපත පරික්ෂා කිරීමෙනි. ඉන් අනතුරුව මුහුණේ ව්‍යුහය හා අස්ථින්, අඳුර හා ආලෝකය, වර්ණ හා වර්ණක භාවිතය ආලෝකකරණ තත්ත්වයන් ආදිය සොයා බලා අංග රචනය කළ යුතුවේ. මූලික වශයෙන් අංග රචනයේදී ප්‍රධාන ශිල්ප ක්‍රම 3 ක් අනුගමනය කෙරේ. [1]

1. පදනම් ආලේප හා වර්ණ භාවිතා ක්‍රම

---

1.සංඛ-රාජ්‍ය නාට්‍ය උත්සව විශේෂ කලාපය 2001 ජූලි-දෙසැම්බර් පිටුව 147

මෙය මුහුණේ වැරදි නිවැරදි කර ලස්සන කිරීම (beauty) සුරූපීකරණය (glamour) මනඃකල්පිත මෝස්තර (fantacy) ආදියත් ස්වභාවික ලක්ෂණ ඉස්මතු කිරීමත් යම් ආකාරයක මෝස්තරාත්මක අංග රචනා ක්‍රමවේදයකි. එය සරල අංග රචනයකි.

2. ගොඩනැගීමේ (මූර්ති) අංග රචනා ක්‍රමය.

මේ සඳහා උදාහරණ වශයෙන් වයස අවුරුදු 25ක පමණ තරුණයෙකු අවුරුදු 60 ක 70 ක පෙනුමැති චරිතයක් ලෙස අංග රචනා කිරීම දැක්විය හැක. මෙම මහළු චරිතය ගොඩ නැගීමේදී ඉටි වර්ග, පුළුන්, ලේටෙක්ස් ආදි ද්‍රව්‍ය භාවිත කරමින් චර්මය මත රැළි ත්‍රිමානය මූර්තිමත් කළ හැක. තවද නළුවාගේ ස්වභාවික හිසකෙස් ඇති හිස වසා තට්ටය හෝ කෘත්‍රිම කෙස් භාවිත කළ හැක.

3. බද්ධ අංග රචනා ක්‍රමය (prosthetic make up technique)

තවදුරටත් වයස වැඩිකොට චරිතයක් අංග රචනය කිරීමේදී මෙම ක්‍රමය භාවිතා කළ හැක. මෙම ක්‍රමය වේදිකා අංග රචනයේ දී භාවිතා කරනුයේ ඉතා අල්ප වශයෙනි. සිනමාව හෝ ටෙලිනාට්‍යකරණයේදී මෙය විශාල වශයෙන් ප්‍රයෝජනයට ගැනේ. ඉතාම සියුම් වූ චර්ම රටා වෙනස්කර වයස අවුරුදු අනූවක පමණ වයසක චරිතයක් හෝ ඩයිනෝසරයකු හෝ ඇණකොන්ඩා වැනි සතෙකු වුවද මෙයින් නිර්මාණය කළ හැක. මේ සඳහා පෙර සූදානම් කරන ලද අවයව හෝ වෙනත් එවැනි බද්ධ කොටස් අච්චු මගින් පිළියෙල කොට අවශ්‍ය ලෙස බද්ධ කොට උවමනා චරිතය නිර්මාණය කර ගනී. බද්ධ කොටස් සකස් කිරීම රසායනාගාරයක් තුළ සිදුවන කාර්යයකි. මේවා නළුවාගේ මුහුණේ හෝ

වෙනත් අවයවයක අච්චුවක් ගෙන රබර් මිශ්‍රණයක් මගින් අවශ්‍ය ආකාරයට සකස් කරනු ලැබේ. [1]

අංග රචනා කලාවේ ඉතිහාසය

වර්තමානයේදී අප සළකන අංග රචනා කලාව වේදිකා නාට්‍ය, රූපවාහිනිය, සිනමාකරණය හා ඡායාරූපකරණයේදී අපට හමුවන අත්‍යවශ්‍යම වූ අංගයකි. අංග රචනා කලාව භාවිතයට ගැනුනේ ඉතාමත් මෑතකදී බව පෙනේ. එසේම අංග රචනා සඳහා ම නිපදවන ලද උපකරණ විලේපන වර්ග හා අනෙකුත් ද්‍රව්‍යයන් උසස් තාක්‍ෂණික ක්‍රම උපයෝගී කොට ගෙන නිෂ්පාදනය කෙරේ. එපමණක් නොව නව මංපෙත් සොයමින් විවිධ පර්යේෂණ ශෛලීන් ආදිය මගින් අංග රචනා කලාව දියුණු කොටගෙන ඇත. වර්තමාන අංග රචනා ශිල්පීන් විශේෂයෙන්ම දියුණු රටවල් හි වේදිකා නාට්‍ය හා චිත්‍රපට කලාවේ අංග රචනා විධි ඉතා උසස් ලෙස භාවිතා කරයි.

මේ සා දියුණුවකට පත්ව ඇති අංග රචනා කලාව ආදි ගෝත්‍රික යුගයේ මිනිසා වෙස්වලා ගැනීමේ සිට මධ්‍ය කාලීන යුගය වනවිට සිටි කාන්තාවන්ගේ රූපලාවන්‍ය ක්‍රමයන් හරහා විකාශනය වි වර්තමාන නාට්‍ය, චිත්‍රපට ආදී කලාවන් දක්වා වර්ධනය වි ඇත.

ආදිකාලීන ගෝත්‍රික ජනයා දඩයමෙන් ජීවිතය ගත කළ කාලයේදී යම් ආකාරයක වෙස්වලාගැනීම් සඳහා ද, ආරක්‍ෂාව සඳහා ද, පුදපූජා සඳහා ද නොයෙකුත් වර්ණ හා අළු වර්ග ඇඟේ තවරා ගනිමින් කටයුතු කොට ඇත. දඩයමේ යන ජනයා සතුනට හඳුනොවි නොපෙනී සිටිමට අතු කොළ වසා ගැනීම හා මුහුණේ, ඇඟේ පරිසරයට අනුකූලව ගල් කුඩු

1.2005.07.21 දින ශිල්පී ජයන්තා රණවක මහතා සමග කළ සාකච්ඡාව

ආදියෙන් සාදා ගත් වර්ණ ඇඟ ගල්වා තිබේ. සතුන් අතරට ගොස් ඔවුන් අතර සිටිමින්ම සතුන් අල්ලා ගැනීමට මෙම උපක්‍රමය භාවිතා කොට ඇත. එමෙන්ම ඉව නැති කොට සතුන් වෙත යාම සඳහා කොළ වලින් ලබා ගන්නා යුෂ වර්ග ඇඟ තවරා දඩයමේ යෙදී ඇත. යක්ෂයන්, දෙවියන් සඳහා යාග කිරීමේදී නොයෙකුත් වර්ණ හෝ අළු වර්ග ඇඟ තවරා ගනිමින් ද කොළ පොතු ආදිය ඇඟෙහි එල්වා ගැනීමෙන් ද පූද පූජා පවත්වා ඇත. [1] පිරිමින්ට මෙන් රැවුලක් නොතිබීම හේතුවෙන් ඩින්කා ගෝත්‍රික කාන්තාවන් නාසයට මුදුවක් පළඳී. [2] එයින් මුහුණට විශේෂ පෙණුමක් ලැබෙන බව ඔවුන්ගේ විශ්වාසයයි.

පැපුවා නිව්ගිනියා වල හේගන් කඳුකරයේ ජීවත්වන ගෝත්‍රික වැසියන් මැටි, පැළැටි, කොළ, කුරුළු පිහාටු, ගස්වල පොතු, අඟුරු ආදී ස්වභාවික දේ මුහුණු හැඩකර ගැනීම සඳහා උපයෝගී කොට ගනී.

රූපලාවන්‍ය කටයුතු කෙරෙහි විශේෂ උනන්දුවක් දැක්වීම කාන්තාවන්ගේ ස්වභාවයයි. ඊජිප්තුවේ හමුවන කාන්තා රූපවල විශේෂයෙන් ඇහිබැම හා ඇස් වටේට ඇඳි ඉරි, තොල් ආලේප, කම්මුල් වල රෝස පැහැ යෙදීම දක්නට ලැබෙන කාරණයකි. මෙයින් හෙලිවන්නේ එම යුගයේ කාන්තාවන් රූපලාවන්‍ය කටයුතු සඳහා යම් ක්‍රමවේදයක් භාවිතා කළ බවයි. මෙම ලක්ෂණ ඊජිප්තු සහ මිසර චිත්‍ර වලද මූර්ති වලද දක්නට ඇත. ග්‍රීක යුගයේ කාන්තාවන් රතු පස් හා සත්ව මේද වලින් කම්මුල් හා තොල් ආලේප කිරීම සඳහා කුරු විශේෂයක් සාදාගෙන තිබේ. [3]

1. සැබෑ මුහුණේ වෙස් මුහුණු - ජයලාල් රෝහණ 1999 පිටුව 42
2. සැබෑ මුහුණේ වෙස් මුහුණු - ජයලාල් රෝහණ 1999 පිටුව 46
3. සැබෑ මුහුණේ වෙස් මුහුණු - ජයලාල් රෝහණ 1999 පිටුව 54